*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අනාවරණ පරීක්ෂණය 2021

**6 ශ්‍රේණිය** | **කතෝලික ධර්මය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

**I කොටස**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1- 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශුද්ධ බයිබලයේ ඇති පොත් ගණන වන්නේ,

(1) 46 (2) 27 (3) 73 (4) 72

02. ජුදා ජාතියේ පමණක් නොව සියලු ජාතීන්ගේ ගැලවුම්කරුවාණන් ජේසුස් වහන්සේ බව පෙන්වා දෙන්නේ,

(1) ශුද්ධවූ මාක්තුමා (2) ශුද්ධවූ මතෙව්තුමා
(3) ශුද්ධවූ ජොහාන්තුමා (4) ශුද්ධවූ ලූක්තුමා

03. මරියතුමියගේ ඥාතිවරිය ලෙස හඳුන්වනු ලබන්නේ .................. තුමියයි.

(1) සාරා (2) රෙබෙකා (3) එළිසබෙත් (4) ආනා

04. දෙවියන්වහන්සේ තම ස්වරූපය අනුව ............. මැවූ සේක.

(1) මිනිසා (2) සතුන් (3) රොබෝ (4) පක්ෂීන්

05. දිව්‍ය සත්ප්‍රසාද වහනස්සේ ස්ථාපිත කරන ලද්දේ,

(1) ගොබ් ඉරිදා (2) මහ බ්‍රහස්පතින්දා
(3) අළු බදාදා (4) මහ සිකුරාදා

06. අසාධ්‍ය රෝගියෙකුට ලබාදෙන දේව ප්‍රසාද නිධානය වන්නේ,

(1) පාපොච්චාරණය (2) අභිවෘධි ආලේපය
(3) ආශිර්වාදකාර බන්ධනය (4) රෝගීන්ගේ ආලේපය

07. "ඉරුදිනත් ණයමංගල්‍ය දිනත් ශුද්ධ ලෙස ගත කරන්න." යන පණත කීවෙනි පණතද?

(1) 2 පණත (2) 3 පණත (3) 1 පණත (4) 4 පණත

08. දේවමාතාවන් පරලොවට වැඩිය මංගල්‍යය සමරනු ලබන්නේ,

(1) අගෝස්තු 15 (2) දෙසැම්බර් 08

(3) ජනවාරි 01 (4) සැප්තැම්බර් 08

09. ජේසුස් වහන්සේගේ මාංශගතවීම සිහිකරනු ලබන යාච්ඤාවකි,

(1) විශ්වාස ලක්ෂණය (2) තුන්කාල ආරාධනාව

(3) දයාධික මනස්ථාපය (4) පාස්කු කාලයේ තුන්කාල ආරාධනාව

10. බර්ණදෙත් දැරියට දේවමාතාවන් දර්ශනය වූයේ,

(1) පාතිමා නුවරදී ය. (2) කානා නුවරදී ය.

(3) ලූර්දු නුවරදී ය. (4) ලන්චියානෝ නුවරදී ය. (ලකුණු 2 x 10 = 20)

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.**

( එළිදරව්ව / බලාපොරොත්තුවේ / පරිසිවරයා සහ අයකැමියා / දන්දීම / අයකැමියෙකි. )

11. කිතුනු අපගේ ජීවිතයේ විශ්වාසයේ හා ........................................................ පදනම වන්නේ ශුද්ධ බයිබලයයි.

12. .............................................................................................. එක්වරුශීලය රැකීමේ ප්‍රධාන පරමාර්ථයකි.

13. ශුද්ධවූ මතෙව්තුමා කැඳවීමට පෙර ..........................................................................................................

14. ශුද්ධ බයිබලයේ අවසාන පොත වන්නේ .................................................................................. පොතයි.

15. අප යාච්ඤා කරන විට "අන්අය හෙළා නොදැකිය" යුතු බව ..................................................................... පිළිබඳ උපමාව පෙන්වා දෙයි. (ලකුණු 2 x 5 = 10)

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. ශුද්ධවූ දෙවන ජුවාම් පාවුළු මුනිතුමා අලි අග්කාට සමාව දුන්නේ ය. (..........)

17. ජුසේතුමා ඊශ්‍රායෙල් වංශයට හා පෙළපතට අයත් කෙනෙකි. (..........)

18. ආරම්භක දේව ප්‍රසාද නිධාන දෙකකි. (..........)

19. ශුද්ධවූ සභාවේ ශික්ෂාපද පහකි. (..........)

20. ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ ගාබ්‍රියෙල් නම් දේවදූතාය ය. (..........)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) උත්පත්ති පොතේ ඇතුළත් කරුණු 02 ක් ලියන්න.
(2) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න.
(3) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන 02 ක් නම් කරන්න.
(4) එක්වරුශීලය රැකිය යුතු දවස් 02 ක් නම් කරන්න.
(5) සුබාරංචි කතුවරු දෙදෙනෙකු නම් කරන්න.
(6) නිතර භාවිත වන පොදු යැදුම් 02 ක් නම් කරන්න.
(7) ජේසුස් වහන්සේ වර්ධනය වූ ආකාර 02 ක් ලියන්න.
(8) දෙවියන් වහන්සේ තුන්වන දිනයේදී මවන ලද මැවිලි 02 ක ලියන්න.
(9) රෝගීන්ගේ ආලේපය නැමැති දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද 02 ක් ලියන්න.
(10) යාච්ඤා වර්ග 02 ක් නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02. (1) ආදිපියවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)
(2) ලූක්තුමා නියැලුනු වෘත්තීන් තුන මොනවාද? (ල. 03)
(3) දෙවියන් වහන්සේ ආදම් සහ ඒව මවා ඔවුන්ට පැවරූ වගකීම් 05 ක් ලියන්න. (ල. 05)

03. (1) යාච්ඤාව යනු කුමක්ද? (ල. 02)
(2) ක්‍රිස්තුන්වහන්සේ යාච්ඤා කළ අවස්ථා 03 ක් ලියන්න. (ල. 03)
(3) ඔබේ ජීවිතයේදී ඔබ යාච්ඤා කරන අවස්ථා 05 ක් නම් කරන්න. (ල. 05)

04. (1) පූජකවරය ස්ථාපිත කළේ කවදාද? (ල. 02)
(2) පූජාප්‍රසාදිතුමන්ලාගේ සේවාවන් 03 ක් ලියන්න. (ල. 03)
(3) දෙමව්පියන් වෙනුවෙන් ඔබ විසින් ඉටුකළ යුතු යුතුකම් 05 ක් ලියන්න. (ල. 05)

05. (1) ජේසුස් වහන්සේ බැලීමට පළමුවෙන්ම පැමිණියේ කවුද? (ල. 02)
(2) ජුදා ආගමික හා ජාතික චාරිත්‍ර 03 ක් ලියන්න. (ල. 03)
(3) ළමා ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් ඔබට ගතහැකි ආදර්ශ 05 ක් ලියන්න. (ල. 05)

06. (1) දේව ප්‍රසාද නිධානයක් යනු කුමක්ද? (ල. 02)
(2) දේව ප්‍රසාද නිධානයක ඇති ප්‍රධාන ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)
(3) ප්‍රසාද ස්නාපනය තුළින් ඔබට ලැබෙන වරප්‍රසාද 05 ක් ලියන්න. (ල. 05)

**06 ශ්‍රේණිය** **අනාවරණ පරීක්ෂණය 2021** **කතෝලික ධර්මය**

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 3 ) 02. ( 4 ) 03. ( 3 ) 04. ( 1 ) 05. ( 2 ) 06. ( 4 ) 07. ( 2 ) 08. ( 1 ) 09. ( 2 ) 10. ( 3 )

11. බලාපොරොත්තුවේ 12. දන්දීම 13. අයකැමියෙකි. 14. එළිදරව්ව

15. පරිසිවරයා සහ අයකැමියා 16. (✓) 17. ( x ) 18. ( x ) 19. (✓) 20. (✓) (ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) දෙවියන් වහන්සේ විශ්වය සහ මිනිසා මැවීම. ♦ ආදම් සහ ඒව පාපයට වැටීම. ♦ කායින් ආබෙල් පිළිබඳ කතා පුවත ............. ආදී පිළිතුරු (පිටු අංක 06)
(2) ව්‍යවස්ථාවලිය/ මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාව / නීතිය / මෝසෙස්තුමාගේ නීතිය.
(3) පූජකවරය / ආශිර්වාදකාර බන්ධනය
(4) අළු බදාදා / මහ සිකුරාදා
(5) ශුද්ධවූ මාක් / ශුද්ධවූ මතෙව් / ශුද්ධවූ ලූක් / ශුද්ධවූ ජොහාන්
(6) උදය ආරාධනාව / රැකවල් දේවදූතයාට යාච්ඤාව / භෝජන ආශිර්වාදය / භෝජන ස්තෝත්‍රය ....... ආදී පිළිතුරු (පිටු අංක 98)
(7) ප්‍රඥා මහිමයෙන් / කාය ශක්තියෙන් / දෙවියන් වහන්සෙගෙන් ප්‍රසාද ලබමින් / මිනිසුන්ගෙන් ප්‍රසාද ලබමින්.
(8) ගොඩබිම හා ගස්කොලන්
(9) පව්කමාව / සදාතන ජීවිතය ලබා ගැනීමට සූදානම් කිරීම .... ආදී පිළිතුරු (පිටු අංක 51)
(10) ප්‍රශංසාව / තුති පිදීම / කමාව අයදීම / ඉල්ලීම (පිටු අංක 118) (ල. 2x10=20)

02. (1) ආබ්‍රහම්තුමා / ඊසාක්තුමා / ජාකොබ්තුමා (ල. 02)
(2) වෛද්‍යවරයෙකි / ඉතිහාසඥයෙකි / චිත්‍ර ශිල්පියෙක් (ල. 03)
(3) දරුසම්පත් ලැබීමට / පොළොව වගා කිරීමට / වගාවෙන් ලැබෙන අස්වැන්න ප්‍රයෝජනයට ගැනීමට / පොළව පුරා පැතිර යාමට / සියලු සතුන් පාලනය කිරීම හෙවත් රැකබලා ගනිමින් වර්ධනය කරමින් මානව අවශ්‍යතා සඳහා යොදා ගැනීමට (පිටු අංක 19) (ල. 05)

03. (1) දෙවියන් වහන්සේට වන්දනා ස්තුති ප්‍රශංසා කරන්නටත්, අපට අවශ්‍ය දේ ඉල්ලා ගන්නටත් ඔවුන් වහන්සේ වෙත සිත යොමු කිරීමකි. (පිටු අංක 92) (ල. 02)
(2) භෞතිස්මය ලැබීමේදී / සුවය දානය කිරීමට පෙර /අපෝස්තුළුවරුන් තෝරා ගැනීමට පෙර ............ (පිටු අංක 96, 97) (ල. 03)
(3) ගමනක් යාමට පෙර / පාඩම් කිරීමට පෙර / නිදා ගැනීමට පෙර / උදේ අවදි වූ විට / කෑම ගැනීමට පෙර හා පසු .......... (සිසුන් ලියා ඇති කරුණු සැලකිල්ලට ගනිමින් ලකුණු ලබා දෙන්න.) (ල. 05)

04. (1) මහා බ්‍රහස්පතින්දා (ල. 02)
(2) සුවිශේෂය දේශනා කිරීම / දිව්‍ය පූජාව පැවැත්වීම. / දේව ප්‍රසාද නිධාන දානය කිරීම. (පිටු අංක 54) (ල. 03)
(3) දෙමව්පියන්ට කීකරු වීම / ගරු කිරීම / උදව් කිරීම / ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම / ඔවුන් මහළු වූ විට සැලකීම, රැකබලා ගැනීම......... (සිසුන් ලියා ඇති කරුණු සැලකිල්ලට ගනිමින් ලකුණු ලබා දෙන්න.) (ල. 05)

05. (1) එඬේරු (ල. 02)
(2) අටවන දින චර්මඡේදනය / නම් තැබීම / පිරිසිදු වීමේ වත්පිළිවෙත් සිදු කිරීම / කුළුදුල් දරුවන් දෙවියන්වහන්සේට කැපකිරීම. (ල. 03)
(3) දෙමව්පියන්ට කීකරුවීම හා උදව් කිරීම. දේව කැමැත්තට අවනත වීම. / ආගමික කටයුතුවල නිරත වීම / යාච්ඤා කිරීම / පවුලේ අය සමඟ සහයෝගයෙන් වැඩ කිරීම. (සිසුන් ලියා ඇති කරුණු සැලකිල්ලට ගනිමින් ලකුණු ලබා දෙන්න.) (ල. 05)

06. (1) උත්ථානව වැඩ සිටින දෙවි සමිඳුන් හමුවීම සඳහා ඇතුළතින් අප වෙත දානය කරනු ලබන දේව වරප්‍රසාද පිටස්තර වශයෙන් සලකුණු කෙරෙන අයුරින් ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇති සංඥා පිළිවෙත් වේ. (ල. 02)
(2) ඇතුළතින් ලබාදෙන දේව වරප්‍රසාද ලබාදීම. / බාහිර ලෙස එය සලකුණු කිරීම / ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර තිබීම. සංඥා පිළිවෙත් අඩංගු වීම. (ල. 03)
(3) දේව දරුකම / ශුද්ධ වූ සභාවේ සාමාජිකත්වය / අනෙකුත් දේව ප්‍රසාද නිධාන ලැබීමට සුදුස්සෙකු වීම / සුරලොවේ හිමිකරුවෙකු වීම. / ජන්ම හා කර්ම පාප කමා කරනු ලැබීම / කර්ම පාපයට නියමිත දඩුවම් මකා දැමීම. (ල. 05)

**II කොටස**

1 ප්‍රශ්නයට ලකුණු 2x10 = 20

2 - 6 වන ප්‍රශ්න සඳහා

| | | | |
|---|---|---|---|
| (1) | කොටස | - ලකුණු | 2 |
| (2) | කොටස | - ලකුණු | 3 |
| (3) | කොටස | - ලකුණු | 5 |
| | | මුළු ලකුණු | 10 |